# ත්‍රිලක්ෂණය පිළිබඳ බෞද්ධ විග්‍රහය

**කොස්වත්තේ සරණංකර හිමි - ත්‍රිපිටකවේදී උපාධි අපේක්ෂක**

ප්‍රාග් බෞද්ධ යුගයේ පවා ලෝකය අවිපරිනාමීය, නිත්‍යය, ශාස්වතය , යන ආකල්පයක් ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයින් වෙත තිබූ බව පෙනේ. ඔවුන් දැරූ එම මතවාද ආනුභූතික ලක්ෂණයන් ගෙන් තොර නිගමනයන් වූ බව පැහැදිලිය. ඒවා ශාස්වත හා උච්ඡේද දෘෂ්ටිවලට ඇතුළත්ව පවතී මෙම දෘෂ්ටිවලින් බැසගත නොහැකි තීරණයන්ට පිළිතුරු දීම වශයෙන් බුදු සමය පහළ විය. වෙනත් ආගම් හා දර්ශනයන්ට හසු නොවූ ලෝකස්වභාවය පිළිබඳ යථා තත්ත්වය හෙළි කිරීමට බුදු සමයට හැකිවිය. ත්‍රිලක්ෂණය මෙහි දර්ශනික පැත්තයි. වෙනත් සමයවාදීන්ට හසුකර ගත නොහැකි වූ දාර්ශනික වූ පදනමක් මීන් ඉදිරිපත් කෙරේ.

ලෝකයේ යථා තත්ත්වය පිළිබඳ විවිධ දාර්ශනිකයන් බුදුරජුන් ගෙන් නොයෙක් විට අසන ලද විවිධ වූ ප්‍රශ්න පෙළ දහමෙහි සවිස්තරව දක්වා තිබේ. ලෝක තතු විචාරන ඔවුන්ට බුදුන් වහන්සේ දුන් පිළිතුර වූයේ අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන දර්ශනික වචන තුනයි. ලෞකික වූ සියල්ල අනිත්‍යය හටගන්නා වූ යමක් වේද ඒ සියල්ල නැතිවන්නා වූ ස්වභාවයෙන් යුක්තයි. ලෝක ස්වභාවය පිළිබඳ සැබෑ තතු මේ වචන තුන තුළ අන්තර්ගතව ඇත. වෙනත් ආගම් මිනිසා නොදන්නාවූ ප්‍රස්තුතයකින් ( ලෝකය දෙවියන්ගේ නිර්මාණයකි. ) විවරණය කරයි.

බුදු දහමේ එසේ නොව හැම විටම ඉන්ද්‍රියගෝචර වන ප්‍රස්තුතවලින් ධර්මය උගන්වයි. සියල්ල අනිත්‍ය යනු ප්‍රත්‍යක්ෂයට ලංවන්නකි අප අවට ඇති පරිසරය පරීක්ෂණයකට යොමු කිරීමෙන් මේ අනිත්‍යතාව ප්‍රත්‍යක්ෂ කර ගත හැකිය.

බුදු සමය ප්‍රත්‍යක්ෂය මුල්කොට ගොඩ නැගුණු දර්ශනයක් බැවින් මෙය අනුභූති වාදී ප්‍රස්තුතයකි. නවීන විද්‍යාව පරීක්ෂණයකින් සත්‍යසොයා ගනී. එය ආනුභූතිවාදීය අනිත්‍යයද ප්‍රත්‍යක්ෂයෙන් අවබෝධ කර ගත යුතුය. එනිසා බෞද්ධ චින්තනයේ පදනමද අනුභූතිවාදීය.

වෙනත් ආගම්වල මෙන් සත්තාවක් බුදු සමයේ නැත. පාරභෞතික සත්තාව යනු බුද්ධියට ගෝචර නොවන අතීන්ද්‍රිය පිළිබඳ විශ්වාසයයි. එනම් දෙවියන් වහන්සේ විසින් ලොව මැවූ සේක යන්නයි. මෙය හරිද වැරදි දැයි ඔප්පු කළ නොහැකි දෙයකි.

( අප්පටි හීරකතං භාසිතං - තෙවිජ්ජක සූත්‍රය )

නොදත් නොදුටු ලෝකයේ ලක්ෂණ වනිතාවකට පෙම් බැඳීම වැනි නොදන්නාවූ දෙවියන් පිළිබඳ කතාවද එබඳුය. බුදු සමයෙහි අධි කාලම බුද්ධිවාදී හෝ ( තර්කය පසුබිම් කොටගෙන ) පාරභෞතික හෝ ( ඊශ්වර නිර්මාණවාදී ) නොවේ.

තක්ක පරියාහතං වීමංසානුචරිතං සයං පටිභානං " තර්කය පදනම් කොට ගෙන පරීක්ෂණ පවත්වන්නේ නම් එහි යථාර්ථය දැනගත නොහැකිය. එයින් ඔහුට සැක පහළ වේ. බෞද්ධ දර්ශනය එසේ නොව ආනුභූතික ලක්ෂණවලින් යුතුය. එසේම මෙලොව වශයෙන් ප්‍රතිඵල දැකිය හැකිය. ( සන්දිට්ඨිකය ) අතීත අනාගතවලට නොයා වර්තමානයේම ප්‍රතිඵල දැකිය හැකිය. ( අකාලිකය. )එනැම කෙනෙකුට එළඹ ප්‍රත්‍යක්ෂයෙන් අවබෝධ කර ගතහැකිය. ( පච්චත්තං වේදී තබ්බො ) මෙවැනි පසුබිමක් මතය බුදුරදුන් ත්‍රිලක්ෂණය පිළිබඳ දේශනා කර වදාළේ.

1. සබ්බෙ සංඛාරා අනිච්චා :- සියලු සංස්කාරයේ අනිත්‍යය.
2. අනිච්චා වත සංඛාරා :- සංස්කාරයන් ඒකාන්තයෙන් අනිත්‍යය.
3. යංකිඤ්චි සමුදය ධම්මං සබ්බං තං නිරෝධ ධම්මං යමක් උපත සවභාව කොට ඇත්තේද එය විනාශයද සවභාව කොට ඇත්තේය.

මේ අනිත්‍යතාව පිළිබඳව මුල් බුදු සමයේ විස්තර කර ඇති ආකාරයයි. මුලු මහත් ලෝකයම ගලාගෙන යන ගංගාවක් (භව ඔය) වැනි යයි බුදු සමය විස්තර කරයි. මුලින් සඳහන් කළ සංඛාර ( රැස්කිරීම් ) සියල්ලම ඉපදීම , විනාශ වීම හා වෙනස් වෙමින් පැවතීම, යන ලක්ෂණ තුනකින් යුක්ත බව බුදුදහම විස්තර කරයි.

තීනිමානි භික්ඛවෙ සංඛතස්ස සංඛත ලක්ඛණානි, කතමානිතීනි උප්පාදො පඤ්ඤායති, වයොපඤ්ඤායති , ඨිතස්ස අඤ්ඤ ථත්තං පඤ්ඤායති යන්නෙන් එය මනාව පැහැදිලි වේ.

ත්‍රිලක්ෂණයේ පළමුවෙනි අංකය වන දුක පිළිබඳව සංයුක්ත නිකායේ විස්තර කරනුයේ " යද නිච්චං තං දුක්ඛං " යමක් අනිත්‍යද එය දුකකි යනුවෙනි. අනිත්‍ය දේ සථිර දෙයක් ලෙස පවත්වා ගත නොහැකිය. දුක්ඛ දුක්ඛ, විපරිනාම දුක්ඛ, සංඛාර දුක්ඛ යනුවෙන් දුක පිළිබඳව කර ඇති විග්‍රහය තුළින් එය පැහැදිලි වේ. යමක් දුක නම් එය අනාත්මයි. " යං දුක්ඛං තදනත්තා " යමක් දුකට හේතු වේ නම් එය, මමය, මාගේය කියා ගත නොහැක. මේ නිසා මිනිසා තුළ ආත්මයක් කියා දෙයක් නොමැත. ( විද්‍යානුකූල පදනම මත බුදුසමය අනිත්‍යයයි. )

මුල් බුදුසමය මුලින් අනිත්‍ය, දුක්ඛ, පිළිබඳ විවරණය කොට තුන්වෙනුව දක්වනු ලබන්නේ අනාත්මයයි. ආත්ම වාදයක් පිළිබඳ මුල් බැස ගත්තාවූ මත වාද පැවති සමයක අනාත්මය. ගැන අවබෝධ කරවීම එතරම් පහසු කාර්යයක් නොවී..එ නිසාය මුලින් අනිත්‍යයත්

ඊළඟට දුකත් විස්තර කොට අවසානයේ අනාත්මය ගැන දේශනා කළේ. වෙනත් ආගම්වලට වඩා බුදු සමයේ කැපීපෙනෙන ලකුණ අනාත්මයයි. මුල් බුදු සමයේ අනාත්ම වාදය මෙසේ පැහැදිලි කරයි.

රූප, වේදනා , සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ වශයෙන් ස්කන්ධ පහකි. මේවා එකක් එකක් වශයෙන් ගත්තා විට ආත්මයක් නොවේ. මේ ස්කන්ධ පහම එකතු වීමෙන් ආත්මයක් නොතැනේ. මෙයට පඤ්චුපාදනක්ඛන්ධා ' යන්නෙන් බුදු සමය හැඳින් වූවා මිස අත්ත ගෙවත් ආත්ම යන වචනය භාවිතා කොට නැත. එනිසා මෙයට ආත්මයක් එකතු කළ නොහැක. බුදු සමය සත්වයා මෙසේ කොටස් කර දක්වන්නේ ආත්ම වශයෙන් ගත යුතු කිසිවක් නොමැති බව විස්තර කර ලීමටය.

සත්වයාට ලෝකය කියා දෙයක් නැත. ස්කන්ධ ධාතු වශයෙන් ඉදිරිපත් වන ලෝකය හැර තවත් පාරභෞතික සත්තාවක් නැත.

' ඉමස්මිං යෙව බ්‍යාමමත්තේ කළෙබරේසසඤ්ඤිස්මිංලොකං ච පඤ්ඤාපෙමි. ලෝක සමුදයං ච පඤ්ඤාපෙමි. ලෝක නිරෝධං ච පඤ්ඤාපෙමි. ලෝක නිරෝධගාමිනී පටිපදං ච පඤ්ඤාපෙමි.

බඹයක් පමණ වූ මේ ශරීරයෙහි සඤ්ඤාව සහිත වූ ලෝකය පනවමි..........

මේ දේශනාවලට අනුව ස්කන්ධ ධාතුවලට අමතරව ලෝකයක් නැති බව ප්‍රකට කර තිබේ.

දේව ආගම්වලට අනුව අප ජීවත් වන ලෝකයට අමතරව ඊට පිටුපසින් පාරභෞතික සත්තාවක් ඇත. එනම් ලෝකය මවන දෙවියෙකි. හින්දු ආගමේ ලෝකය මායාවකි. ඊට පිටුපසින් ඇත්තේ නියම සත්තාවයි. එනම් බ්‍රහ්මන්ය.

බුදු දහමෙහි ද්වයක් නැත. පිටු පසින් පාරභෞතික ලෝකයක් නැත. මේ ලෝකය පවතින හේතු මේ ලෝකයේම ඇත. පිටස්තර වශයෙන් වෙනත් ලෝකයක් නැත. නිවන යනු ලෝකයෙන් බැහැර වූ දෙයක් නොවේ. බුදු සමයට අනුව නිවන යනු මුලු මහත් සංසාරික පැවැත්ම හිස් කළ පුද්ගලයායි. ග්‍රාහකයෙක් නැත. චින්තනයක් ඇතත් චින්තකයෙක් නැත.

' කම්මස්ස කාරකො නත්ථි - විපාකස්සච වේදකො

ආත්මවාදීන් විඤ්ඤාණයේ හෝ විඤ්ඤාණයේම එක්තරා ගුණයක් ආත්මය සේ හඳුන්වයි. බුදු සමයට අනුව විඤ්ඤාණය ආත්මය නොවේ. සත්වයා ධාතු කොටස් 18 කට බෙදා දක්වා ඇත්තේ මේ නිසාය. විඤ්ඤාණය ස්වතන්ත්‍ර නොවේ. එයට තනිව නැගිසිටීමේ හා පැවතීමේ ශක්තියක් නැත. විඤ්ඤාණය උපදින්නේ හේතු ප්‍රත්‍ය සහිතවය.

' අඤ්ඤත්‍ර පච්චායා නත්ථි - විඤ්ඤාණස්ස සම්භවො

ප්‍රත්‍යයක් නොමැතිව විඤ්ඤාණයක් හට නොගනී. විඤ්ඤාණයක් හටගන්නේ තවත් හේතු ප්‍රත්‍ය තීපයක් හා සම්බන්ධ වීමෙනි. 'චක්ඛුං ච පටිච්ච රූපෙච, උප්පජ්ජති චක්ඛු විඤ්ඤාණං ඇසත් රූපයත් නිසා චක්ඛු විඤ්ඤාණය උපදී. අනික් ඉන්ද්‍රියන්ටත් මෙසේම හේතු වන බව දක්වා තිබේ. මේ අනුව තවත් දෙයක හේතුවෙන් විඤ්ඤාණයක් හට ගනී. කිසි විටකෙත් ස්වතන්ත්‍ර නොවේ. මෙය අවබෝධ කොට ගත හැකි සරල කෙටි සූත්‍රයකින් මෙසේ දක්වා ඇත.

අස්මිං සති ඉදං හොති. (මෙය ඇති කල එය ඇති වෙයි.)
ඉමස්සු ප්පා දා ඉදං උප්පජ්ජති (මෙය ඉපදීමෙන් එය උපදියි.)
ඉමස්මිං අස්ති ඉදං න හොති (මෙය නැති කල එය නැති වෙයි.
ඉමස්ස නිරෝධා ඉදං නිරුජ්ඣති. (මෙය නැති වීමෙන් එය නැති වෙයි.)
පුද්ගලයාගේ නැවැත්ම හා පැවැත්ම මේ අයුරින් ඉතා හොඳින් පැහැදිලි කර ගත හැකිය. මෙවැනි පාඨවලින් පෙනෙන්නේ [illegible]කල ධම් පරම්පරාවක් මිස ආත්මයක් කියා ගත යුතු දෙයක් නැති බවයි.

මුල් බුදු සමයේ විග්‍රහයන්ට අනුව එදා භාරතීය චින්තනයෙහි මුල් බැසගත් ආත්මවාදී සංකල්පය බුදුසමය විසින් ත්‍රිලක්ෂණය මුල්කොට බිඳහැරී කරන ලද බව මෙයින් පෙන්වා දිය හැකිය.

---

ආශ්‍රිත ග්‍රන්ථ.

මජ්ඣිම නිකාය ත්‍රි:ග්‍රන්ථ. බුද්ධ ධම් සංග්‍රහය. මාපලගම සෝම්ස්සර හිමි, බුදුන් වදාළ ධර්මය වල්පොල රාහුල හිමි- 'සබ්බෙ සංඛාරා අනිච්චා' රද්දැල්ගොඩ පඤ්ඤාලොක හිමි